# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1836/14 - 2013 නොවැම්බර් මස 13 වැනි බදාදා - 2013.11.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝගය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති දැනටමත් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය හැර දෙවන උපලේඛනයේ I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම ලේඛනයේ II වැනි තීරුවෙහි තදානුරූපිව මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ද ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, එම ප්‍රදේශය එම වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

තවද මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශය සහ දෙවන උපලේඛනයේ II වැනි තීරයේ දක්වා ඇති ප්‍රදේශයද ඇතුළුව සමස්ථ ප්‍රදේශය පුළුල් කරන ලද බණ්ඩාරවෙල නාගරික බල ප්‍රදේශය ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2013 ඔක්තෝබර් මස 14 වැනි දින,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03.

I **උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| 1980 අගෝස්තු මස 04 දිනැති අංක 100/4 දරන *අතිවිශෙෂ ගැසට්* නිවේදනය | බණ්ඩාරවෙල නාගරික සංවර්ධන ප්‍රදේශය |

## II උපලේඛනය

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල නාගරික සංවර්ධන ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම

*I වැනි තීරුව*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 65ජී - බණ්ඩාරවෙල නැගෙනහිර, 65බී - බණ්ඩාරවෙල බටහිර, 65ඊ - ඉණිකම්බැද්ද, 67ජී - වැවතැන්න, 67ඩී - උතුරු කැබිල්ලවෙල, 66ජී - තංතිරිය (කොටසක්), 66ඩී - මහ උල්පොත (කොටසක්), 65ඒ - දකුණ කැබිල්ලවෙල (කොටසක්), 67සී අඹේගොඩ (කොටසක්), 67 - ඇත්තලපිටිය (කොටසක්), 67එච් - දිගන තැන්න (කොටසක්), 67කේ - ගෙඩියාරොද, 66 - කිණිගම සහ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 69සී - පල්ලෙපේරුව (කොටසක්) සහ 67බී - බිඳුනුවැව සහ හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 64බී එරනවෙල (කොටසක්) යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පිහිටියාවූ මෙහි II වැනි තීරුවේ විස්තර වන මායිම් සහ ඉම් වලින් සමන්විත වූ මුළු මහත් භූමි ප්‍රදේශය.

*II වැනි තීරුව*

*උතුරට :*

අඹේගොඩ ඔය මධ්‍ය රේඛාව, කොස්ගොල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය ආරම්භක ලක්ෂ්‍යය වශයෙන් ගෙන එතැන් සිට කොස්ගොල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන, ගිණිකොන නැවත ඊසාන හා ගිණිකොන දෙසට වැලිමඩ මාර්ගය දෙසට ඇති අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට එම අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරට හා ඊසාන දෙසට වැලිමඩ බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව මුණගැසෙන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට වැලිමඩ- බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොන දෙසට කිතුල්දෝව අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට කිතුල්දෝව අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන, වයඹ, ඊසාන, ගිණිකොන, නැගෙනහිර, ඊසාන, නැගෙනහිර, ගිණිකොන, ඊසාන, නැගෙනහිර හා ඊසාන දෙසට බණ්ඩාරවෙල -හාපත්ගමුව ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට බණ්ඩාරවෙල - හාපත්ගමුව ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දෙසට සින්නමාළිගාතැන්න අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට සිස්නමාළිගාතැන්න අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන හා උතුර දෙසට අමුණුදෝව හාපත්ගමුව මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට අමුණුදෝව - හාපත්ගමුව මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දෙසට බණ්ඩාරවෙල - ඇටම්පිටිය ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට බණ්ඩාරවෙල - ඇටම්පිටිය ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දෙසට ඇත්තලපිටිය ඔය මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට ඇත්තලපිටිය ඔය මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර, ගිණිකොන, ඊසාන, දකුණ හා ඊසාන දෙසට නත්තරන් කඳුර මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට නත්තරන් කඳුර මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන, ගිණිකොන, නැගෙනහිර, ගිණිකොන ඊසාන, ගිණිකොන, ඊසාන, ගිණිකොන, ඊසාන, ගිණිකොන, ඊසාන, නැගෙනහිර හා ඊසාන දෙසට වටගමුව බිඳුනුවැව මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට වටගමුව බිඳුනුවැව මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොන, උතුර, නැගෙනහිර, දකුණ, ගිණිකොන, නැගෙනහිර, දකුණ, නිරිත, දකුණ හා ඊසාන දෙසට ඌව අධ්‍යාපන විද්‍යාපීඨය දෙසට ඇති අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන දෙසට උඩ කුඹල්වෙල කඳුර මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද;

*නැගෙනහිරට :*

ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට උඩකුඹල්වෙල කඳුර මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොණ හා දකුණු දෙසට බදුල්ල - බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට බදුල්ල - බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ, බස්නාහිර, නිරිත, දකුණ හා නිරිත දෙසට මිහිඳු මාවත මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට මිහිඳු මාවත මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොන දෙසට බණ්ඩාරවෙල - හීල්ඔය ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට බණ්ඩාරවෙල - හීල්ඔය ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණ, නිරිත, බටහිර, දකුණ, නිරිත හා දකුණු

II උපලේඛනය (සම්බන්ධිතයි)

*I වැනි තීරුව*

*II වැනි තීරුව*

දෙසට කන්දේඅරාව මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට කන්දේඅරාව මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණ, ගිණිකොන, දකුණ, ගිණිකොන හා නැගෙනහිර දෙසට පුනාගල මාර්ගය මහඋල්පත අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව මුණගැසෙන ලක්ෂ්‍යය දක්වා ද;

*දකුණට :*

ඉහත අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට පුනාගල මාර්ගය - මහඋල්පත අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත, දකුණ, බටහිර හා නිරිත දෙසට බණ්ඩාරවෙල - පුනාගල ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට බණ්ඩාරවෙල - පුනාගල ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත, බටහිර, වයඹ, බටහිර, නිරිත, වයඹ, බටහිර, නිරිත, දකුණ, නිරිත, බටහිර, වයඹ, උතුර, වයඹ හා නිරිත දෙසට ශ්‍රී සුමනවංශ මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට ශ්‍රී සුමනවංශ මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණ, නිරිත, දකුණ, බටහිර, දකුණ, බටහිර දෙසට පුනාගල මාර්ගය - කහටගහඅරාව හංදිය අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව මුණගැසෙන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට පුනාගල මාර්ගය - කහටගහඅරාව හංදිය අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර, නිරිත, බටහිර, දකුණු, නිරිත, ගිණිකොන හා දකුණු දෙසට (කහටගහආරාව හන්දිය) දඹුගොල්ල අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට දඹුගොල්ල අතුරු මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොන, උතුර, නැගෙනහිර දෙසට කහටගහඅරාව කඳුර මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට කහටගහඅරාව කඳුර මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත දෙසට ඉද්දගංඅරාව ඔය මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට ඉද්දගංඅරාව ඔය මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර, වයඹ, නිරිත, වයඹ, බටහිර දෙසට ඇල්ලතොට ඔය මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද;

*බටහිරට :*

අවසන් වරට සඳන් කරන ලද ලක්ෂයේ සිට ඇල්ලතොට ඔය මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන, වයඹ, බටහිර, උතුර, වයඹ, ඊසාන දෙසට අ. ග. පි. 193 කහවත්තේවෙල ගමේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට අ. ග. පි. 193 කහවත්තේවෙල ගමේ නැගෙනහිර මායිම ඔස්සේ ඊසාන, නැගෙනහිරට, උතුරු දෙසට බණ්ඩාරවෙල නගර සභා සීමා බටහිර මායිම මුණ ගැසෙන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට බණ්ඩාරවෙල නගර සභා සීමා බටහිර මායිම ඔස්සේ වයඹ, ඊසාන, වයඹ, බටහිර, ඊසාන, වයඹ, ඊසාන, උතුර දෙසට බණ්ඩාරවෙල - වැලිමඩ ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට බණ්ඩාරවෙල - වැලිමඩ ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ, නිරිත, දකුණ, නිරිත, උතුර, වයඹ, නිරිත, උතුර, වයඹ දෙසට සිරිමල්වත්ත කඳුර මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට සිරිමල්වත්ත කඳුර මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත, වයඹ, නිරිත දෙසට කහගොල්ල ඔය මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට කහගොල්ල ඔය මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ, නිරිත, වයඹ දෙසට අඹේගොඩ ඔය මධ්‍ය රේඛාව මුණගැසෙන ලක්ෂ්‍යය දක්වා ද; එතැන් සිට අඹේගොඩ ඔය මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ, උතුර, වයඹ, දකුණ, වයඹ, ඊසාන හා වයඹ දෙසට උතුරු මායිමේ ඇති ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

11-966

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.